Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# බලපෑම් ඇගැයීමේ අත්දැකීම්:
# අප කරන යහපත් දෑ මොනවාදැයි දැනගත හැකිද?

මේරි බී. ඇන්ඩර්සන් (Mary B. Anderson)

www.berghof-handbook.net




1. හැඳින්වීම 246
2. සාම ව්‍යාපෘතිය සඳහා වූ දේශීය හැකියාව 247
3. සාම භාවිත ව්‍යාපෘතිය ගැන ප්‍රත්‍යාවලෝකනය 250
4. බලපෑම් ඇගැයීම සහ සැලසුම් කිරීමේ LCPP අත්දැකීම 254
5. සාම භාවිතයන්හි බලපෑම් ඇගැයීමේදී RPP අත්දැකීම 257
6. LCPP සහ RPP අතර සමානතා සහ වෙනස්කම් 259
7. අවසන් නිරීක්ෂණය 261
8. වැඩිදුර කියවීම 263


©2006 Berghof Research Center for Constructive Conflict Management

# බලපෑම් ඇගැයීමේ අත්දැකීම්: අප කරන යහපත් දෑ මොනවාදැයි දැනගත හැකිද?

මේරි බී. ඇන්ඩර්සන් (Mary B. Anderson)

## 1. හැඳින්වීම

වත්මන් ගැටුම් පිළිබඳ සාකච්ඡා නිතරම පාහේ ඒවායේ සංකීර්ණත්වය ඉස්මතු කොට දක්වයි. මේ ගැටුම්වලට සිවිල් සහ හමුදාමය වශයෙන්ද, ඍජුව සහ වක්‍රව ද යන දෙවිධියටම බොහෝ ජනයා සම්බන්ධ වෙති; ඔවුහු ආභ්‍යන්තරික, අන්තර්-කණ්ඩායම් ඉතිහාසයන්ට සහ බාහිර අන්තර්ජාතික ලාභාපේක්ෂාවනට සම්බන්ධ වෙති; ඔවුහු බහුවිධ සහ තරගකාරී පෙළඹවීම් මගින් මෙහෙයවනු ලැබෙති. එම පෙළඹවීම්වලින් සමහරක් උත්කෘෂ්ට මෙන්ම විශිෂ්ට වන අතර, අනෙක්වා ආත්මාර්ථකාමී මෙන්ම පටු ඒවාය. 'එසේම, සංකීර්ණ මානුෂීය හදිසි අවස්ථා' (CHEs) දුක් කම්කටොළු පහත හෙළීමට දරන මානුෂික ප්‍රයත්නයන්හි සිට සටන් අවසාන කිරීම සඳහා වන පහළ මට්ටමේ සහ ඉහළ මට්ටමේ ප්‍රයත්න දක්වා වූ පරාසයක විවිධාකාර ජාත්‍යන්තර ප්‍රතිචාර ගණනාවක් ඇති කරයි.

එහෙත් එවැනි ස්තරගත සංකීර්ණතාවක් ඇති තත්ත්වයක් යටතේ පැවැත්ම සහ/හෝ සාමය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ජාත්‍යන්තර ආයතනවලට සිය බලපෑම් මොනවාදැයි තීරණය කරගත හැකිවන්නේ කෙසේද? එවා අන්තර්කණ්ඩායම් ගැටුම්වලට බලපාන ඒවා වශයෙන් සිය කටයුතුවල ප්‍රතිඵල සොයාගෙන ඒවා තක්සේරු කරන්නේ කෙසේද?



ගැටුම් අවම කිරීම සඳහා වූ මානුෂික හෝ දේශපාලන ප්‍රයත්න සොයාගෙන ඇගැයීමට ඇති දුෂ්කරතාවයට පරිමාණ පැති දෙකක් තිබේ. පළමු වැන්න ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා වූ නිර්ණායකයන්ට හෝ දර්ශකයන්ට අදාළය. ගැටුම් අඩු කිරීම සම්බන්ධ ප්‍රගතිය මැන බැලීමේ සුදුසු ආකාර සහ විධි ක්‍රම මොනවාද?

දෙවැනි පරිමාණය හේතු දැක්වීමට අදාළය. සංකීර්ණ පරිසරයක බොහෝ දේවල් සිදුවන විට කුමන ක්‍රියාවන් කුමන ප්‍රතිඵල ගෙනදෙන්නේ දැයි දැන ගන්නේ කෙසේද? ධනාත්මක පියවර විනාශකාරී ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් යටපත් වී පවතින්නේ නම්, කිසිම ප්‍රගතියක් ඇති වී නැතැයි ඉන් අදහස් කෙරෙන්නේද? ප්‍රචණ්ඩ ක්‍රියා අඩුවන්නේ නම් මෙය සිදු වූයේ ප්‍රචණ්ඩ ක්‍රියා අවම කිරීම සඳහා වූ වැඩසටහන් ප්‍රයත්න නිසාය හෝ වෙනස්කම් සඳහා වූ වෙනත් සාධක නිසාය වශයෙන් අවංක ව කිව හැකිද?

ගැටුම් තුළ හෝ ගැටුම් පිළිබඳව කටයුතු කරන ආයතනවල බලපෑම් පිළිබඳ වූ මෙම ප්‍රශ්න ඉදිරි පිටුවලදී අපි සලකා බලන්නෙමු. II සහ III කොටස්වලදී මෙම ආයතන කටයුතු කරන සමාජයන් තුළ ගැටුම් කෙරෙහි ඒවායේ බලපෑම් වැඩිදුර අධ්‍යයනය කිරීම සඳහා මෙම ආයතන විසින් දරන ලද සහයෝගී ප්‍රයත්න දෙකක් විස්තර කරමින් අපි මෙය ආරම්භ කරමු. පළමුවැන්න වන සාම ව්‍යාපෘතිය සඳහා වූ දේශීය හැකියා (LCCP) ව්‍යාපෘතිය, මානුෂික සහ සංවර්ධන ආධාර ආයතන තමන් ආධාර

දෙන ප්‍රදේශවල ජීවිත ආරක්ෂා කිරීමටත්, දුක් වේදනා දුරලීමටත්, දේශීය සංවර්ධනයට සහායදීමටත් දරන ප්‍රයත්න අන්තර් කණ්ඩායම් ගැටුම්වලදී අන්තර්-ක්‍රියාකාරී වන්නේත්, සමහර අවස්ථාවල දී ඒවා ශක්තිමත් කරන්නේත් කෙසේදැයි අවබෝධ කර ගැනීමට උත්සාහ දරමින්, එම ආයතන සමබන්ධකර ගනියි. දෙවැනි ව්‍යාපෘතිය වන සාම භාවිතා ව්‍යාපෘතිය ගැන ප්‍රත්‍යවේක්ෂණය (RPP) නිශ්චිත ලෙස ගැටුම් සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන ගණනාවකින් යුත් වෙයි; එනම්, අන්තර් කණ්ඩායම් මැදිහත්වීම්, සන්ධානගත කිරීම, සාම අධ්‍යාපනය, ගැටුම් කළමනාකරණය, ගැටුම් ව්‍යාවර්තනය සහ ගැටුම් අනතුරු අඩු කිරීමේ වෙනස් ප්‍රවේශයන් ක්‍රියාත්මක කරන ආයතනය. මෙම කොටස්වල දී අපි මෙම ව්‍යාපෘති දෙකෙහි පසුබිම ප්‍රවේශ සහ ප්‍රතිඵල විස්තර කරන්නෙමු.

IV කොටසේදී අප ගැටුම් කෙරෙහි මානුෂික සහ සංවර්ධන වැඩසටහන්වල බලපෑම් තක්සේරු කරන ආකාරය ගැන LCCP මගින් උගත් දේ පිළිබඳ සමාලෝචනයක් සලකා බලන අතර, V කොටසේදී ගැටුම් අවම කර සාමය ගොඩනැගීම අරමුණු කරගත් ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵල තක්සේරුකරන ආකාරය සම්බන්ධයෙන් සොයාගත් කරුණු ඉදිරිපත් කරන්නෙමු. අවසානයේ දී VI කොටසේ දී තක්සේරු කිරීමේ තාක්ෂණයන්ගෙන් එකක් ගැටුම තුළ ක්‍රියාත්මක වන්නේද නැත්නම් ගැටුම මත ක්‍රියාත්මක වන්නේද යන්න අනුව අවශ්‍ය කරන තක්සේරු කිරීමේ තාක්ෂණයන්හි සමානකම් සහ වෙනස්කම් සාකච්ඡා කරන්නෙමු.

## 2. සාම ව්‍යාපෘතිය සඳහා වූ දේශීය හැකියා



සීතල යුද්ධයේ අවසානයෙන් වසර පහකට පසු, 1994 දී බරපතල, බෝහෝවිට ප්‍රචණ්ඩ වූ අන්තර් කණ්ඩායම් ගැටුම් මතු වූ ප්‍රදේශවල මානුෂීය සහ සංවර්ධන ආධාර දෙන බොහෝ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන උද්ගත විය. මේවායින් බොහෝ ප්‍රදේශ කලින් සුසංගත ව ක්‍රියාකාරී වූ සමාජයන් වශයෙන් පැවැති පසුව අනුකණ්ඩායම් අතර කෙරෙන, සිවිල් ජනතාව සම්බන්ධ බරපතළ සිවිල් යුද්ධ පවතින ප්‍රදේශ බවට පත් වූ ඒවාය.

තමන් දුන් ආධාර සම්බන්ධයෙන් නොකඩවා හිලව් කිරීම් කළ බවට තමන් හමු වේ ඇති සාක්ෂි ගැන බොහෝ දේශීය හා විදේශීය රාජය නොවන සංවිධාන කාර්ය මණ්ඩල සැලකිළිමත් වූහ. තමන් දුන් ආධාර ඒවා අවශ්‍ය කරන සිවිල් ජනතාවට ලැබිය යුතු යැයි ද යුද්ධයේ පාර්ශ්වයන් සම්බන්ධයෙන් අපක්ෂපාතී වි යුතු යැයි ද ඔවුන් සිතුව ද, එම ආධාර බොහෝ විට ප්‍රාදේශීය යුදනායකත්වය, සටන් කාමීන් හෝ පක්ෂග්‍රාහී දේශපාලනඥයන්ගේ ග්‍රහණයට අසු වී ඇති බව ඔවුහු දනිති.

සමහර අවස්ථාවලදී ද්‍රව්‍ය සොරකම් කරනු ලැබ හමුදා ප්‍රයෝජනය සඳහා හෝ ආයුද මිලදී ගැනීම සඳහා හෝ යොදවනු ලැබිණි; සමහර අවස්ථාවලදී යුද අරමුණු කොටගෙන, ජනතා සංසරණය පාලනය කිරීමේ ක්‍රමයක් වශයෙන් බලධාරීහු ආහාර බෙදා හැරීමේ ස්ථාන හා වේලාවන් පාලනය කළහ. මානුෂික ආධාර වැරැදි ලෙස යොදාගැනීම සහ අයුතු ලෙස භාවිත කිරීම ප්‍රචලිත ජන්ම ගතියක් විය. දේශීයකරණය වූ අන්තර්-කණ්ඩායම් යුද ගැටුම් සන්දර්භය තුළ මේවා නොවැක්විය හැකි දේවල් යැයි සමහර ආධාර සේවකයින් විශ්වාස කළ අතර, තවත් අය ආධාරවලින් ඇතිවන මෙවැනි ඍණාත්මක බලපෑම් වළකාලීමට උත්සාහ කළහ.

මෙවැනි තත්ත්වයක් යටතේ, ගැටුම් කලාපවල කටයුතු කරන බොහෝ ක්‍රියාකාරී රාජ්‍ය නොවන සංවිධානවල සාමූහික ප්‍රයත්නයක් වශයෙන් සාමය සඳහා දේශීය හැකියා ව්‍යාපෘතිය (LCPP) සංවිධානය කෙරිණි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, සෙසු ආයතනවල පුළුල් සහ විවිධ වූ අත්දැකීම් එක් තැන් කොට, ඒවා සන්සන්දනය හා විශ්ලේෂණය කිරීම මගින්, ආධාරවලින් ගැටුම් උත්සන්නවීමේ බලපෑම කොතරම් කණගාටුදායක වුවද, එසේ වීම යුද්ධය මැද 'ව්‍යාපාර කරගෙන යාමේ' අනිවාර්යය ලක්ෂණයක් ද, එසේ නැතිනම්, මෙවැනි අහිතකර ප්‍රතිඵල සීමා කරන හෝ නැති කරන ආකාරයේ ආධාර ලබාදීමේ විකල්ප තිබේද යනු සොයා බැලීමයි . තම ආධාර ලබාදීම මගින් ගැටුම් අවුස්සාලන්නේ හෝ දිග්ගසන්නේ නැතිව, (මානුෂීය සහ සංවර්ධන ආධාරදීමෙහි කටයුතු කරන) ජාත්‍යන්තර ආධාර ආයතන ගැටුම් ප්‍රදේශවල තමන් කරන්නට අදහස් කරන යහපත් කටයුතු කළ යුත්තේ කෙසේදැයි සලකා බලන්නට LCPP ඉදිරිපත්වී ඇත. එසේම, ගැටුම් තීව්‍ර කිරීමේ සෘණාත්මක ප්‍රතිඵල නොව, ඒ වෙනුවට ගැටුම්වලින් වැලකී, ගැටුමට පාදක වූ කාරණාවලට පිළියම් සෙවීම සඳහා අවශ්‍ය ආයතනික සැකැස්ම ස්ථාපිත කිරීම ආරම්භ කිරීමට දේශීය ජනතාවට සහාය වන ආකාරයට එවැනි ආධාර දිය යුත්තේ කෙසේද?

ඊළඟ වර්ෂවලදී (LCPP) විසින් රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් ආධාර කණ්ඩායම් ගණනාවක කටයුතු කරන පුද්ගලයින් සිය ගණනක්, වඩා හොඳ ප්‍රතිඵල ගෙන දෙන බවට සහතික වන ආකාරය අවබෝධ කර ගැනීම සඳහා සිය කටයුතු අධ්‍යයනය කිරීමෙහි සහ විශ්ලේෂණය කිරීමෙහි නිරත කැරවිණි. ව්‍යාපෘතියේ පළමු මාස 18 තුළ දී ගැටුම් කලාප දාහතරක ආධාර වැඩසටහන් පිළිබඳව ප්‍රත්‍යෙක අධ්‍යයන පහළොවක් ලියන ලදී.



ඊළඟ වසර තුළදී ප්‍රතිපෝෂණ ලබාගැනීමේ වැඩමුළු විස්සකට වැඩි සංඛ්‍යාවක් පැවැත් වූ අතර ඒවායින් වැඩි ගණනක් ගැටුම් ප්‍රදේශවල සමහර ආධාර දෙන රටවල රාජ්‍ය නොවන සංවිධාන කාර්යමණ්ඩල සමග පවත්වන ලදී. මෙම වැඩමුළුවල දී තමන්ගේ අත්දැකීම් ඇසුරින් ප්‍රත්‍යක අධ්‍යයනවලදී උගත් දේ පරික්ෂා කර බැලීමට සහභාගී වන්නනට ආරාධනා කෙරිණි. මෙම පාඩම්, ආයතන වැඩකටයුතු කළ ගැටුම් ප්‍රදේශ පුරා මුහුණ දෙන ලද යථාර්ථයන්ට වඩාත් වලංගු වූ ද වඩාත් සත්‍ය වූද ඒවා බවට පත් කරනු වස්, ඒවාට යම් යම් දේ එකතු කරන ලෙසත් ඒවා වෙනස් කරන ලෙසත්, සංශෝධනය කරන ලෙසත්, වැඩි දියුණු කරන ලෙසත් ඒවා ගැන යළි සිතා බලන ලෙසත් ඔවුන්ගෙන් යළි ඉල්ලා සිටිනු ලැබීය.

මෙම වැඩමුළුවලින් ලැබුණු සමුච්චිත ඉගෙනීම *(Do No Harm : How Aid supports Peace-or War* (Anderson 1999) නම් කෘතිය ප්‍රකාශයට පත් කිරීමට පදනම සැපයීය. අනතුරුව, LCPP පාඩම්වල ප්‍රයෝජනවත් බව සහ කාර්යක්ෂම බව නිශ්චිත කරනු වැනිය. ලෝකය පුරා ක්‍රියාකාරී ගැටුම් ප්‍රදේශ දොළහක කටයුතු කරන සක්‍රීය රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩලය විසින් නිශ්චිත කාලසීමාවල නිශ්චිත ස්ථානවල දී පරික්ෂාවට ලක් කෙරිණි. මෙම කාර්යමණ්ඩල පිරිස, ආධාර ව්‍යාපෘතිවල ජීවන චිටත් ක්‍රියාත්මක සැලැස්ම සහ මෙහෙයවීම සඳහා 'හානි නොකිරීමේ' ප්‍රවේශය යොදා ගනිමින් පරීක්ෂණ පවත්වා, එමගින් අන්තර්-කණ්ඩායම් ගැටුම් කෙරෙහි ජාත්‍යන්තර ආධාරවලින් කෙරෙන බලපෑම් හඳුනා ගන්නේ කෙසේදැයි තවදුරටත් අධ්‍යයනය කළහ. 2000 සැප්තැම්බර් මස LCPP හි මෙම අදියර අවසන් වූ පසු, ආයතන ගණනාවක් එම ආයතනවල පිරිස් පෙර පරිදිම, පෙර

අවබෝධයෙන්ම, කටයුතු කිරීම සහතික කිරීම සඳහා, ක්ෂේත්‍ර අත්දැකීම් තම මූලස්ථානවලට පෙරළා ගෙන යමින් 'මූල ධාරා ප්‍රවේශය' නම් ඔවුන්ම හඳුන්වන වැඩපිළිවෙල දියත් කළහ.

LCPP මගින් ඉගෙන ගනු ලැබුවේ කුමක් ද? මෙහි සාකච්ඡා කරනු ලබන බලපෑම් සහ ඇගැයීම් සඳහා පාඩම් තුනක් අදාළ වේ.

පළමුව, බොහෝ පරිස්ථිති ඔස්සේ බැලීමෙන් සහ බොහෝ වර්ගවල ආධාරක වැඩසටහන් ඇතුළත් කරගනිමින් මානුෂීය හා සංවර්ධන ආධාරත් ගැටුමත් අතර, අන්තර්-ක්‍රියාකාරීත්වයේ පැහැදිලි සහ පුනරුක්ත වන රටාවන් හඳුනාගැනීමට LCPP යට හැකි විය. ආධාරවල සම්පත් හුවමාරු කිරීම මගින් සහ 'ගම්‍යමාන ආචාර ධර්ම පණිවුඩ' මගින් ආධාරවලට ගැටුම් අවුලුවා ලිය හැක්කේ කෙසේදැයි දැන් අපි නිශ්චිතව ම දනිමු (Anderson 1999). විවිධ වර්ගයේ ගැටුම් ගණනාවක් සඳහා දෙන ලද විවිධ වර්ගයේ ආධාර වැඩසටහන් ගණනාවක දී ලබාගත් සිය අත්දැකීම් ප්‍රත්‍යවේක්ෂණය කරමින් ආධාර සේවකයින් බෝහෝ දෙනෙකු විසින් මෙම රටාවන් හඳුනාගනු ලැබූ බව සඳහන් කිරීම වැදගත්ය. සිදුවීම් සිදුවිය හැකි ආකාරය පිළිබඳ උපකල්පන වෙනුවට ස්ථාවර ක්ෂේත්‍ර පදනම් කරගත් දැනුම ඒවාහි ඇතුළත් වේ.

දෙවනුව, ගැටුම් පරිස්ථිතිවල පුළුල් මතුපිට දක්ම ද ආධාර සහ ගැටුම් අන්තර්-ක්‍රියාකාරී වන ආකාර සම්බන්ධයෙන් වැදගත් අන්තර්ඥානයක් ලබාදෙන ගැටුම්වල ලක්ෂණ පිළිබඳව ඉඟි ලබා දුන්නේය. සියලු ගැටුම් දෙයාකාර බලවේග ලක්‍ෂණ දරන බව LCPP මඟින් සොයා ගැනිණි. එක් අතකින්, ගැටුම් ප්‍රදේශ තුළ ජීවත් වන ජනතාව අනු-කණ්ඩායම් අනන්‍යතා අනුව එකිනෙකාගෙන් බෙදී සිටිති. අනෙක් අතින්, ඒ අතරම ගැටුම් තුළ ජීවත්වන ජනතාව බෙදුම් රේඛා ඔස්සේ එකිනෙකා සමග සම්බන්ධ ව සිටිති. ජනතාව කලින් අසල්වැසියන් හා මිතුරන් ලෙස ජීවත් වූ ජාතීන් තුළ සිදුවන ගැටුම්වල දී දෙවැන්න විශේෂයෙන්ම සත්‍යය; එය ඉතියෝපියාව සහ එරිට්‍රියාව අතර ඇති වූ යුද්ධය වැනි දේශසීමා හරහා සිදුවන යුද්ධවලට ද අදාළය.

කණ්ඩායම් අතර බෙදීම් මගින් එම යුද්ධ පෙන්නුම් කෙරෙන්නේය ස්වයං සිද්ධි සත්‍යයකි . එහෙත් සිය ආධාර ගැටුමට බලපාන්නේ කෙසේදැයි ආධාර සේවකයින් වටහාගන්නට නම් ඔවුන් මෙම බෙදීම්වල පදනම සහ පරිමාණ ද වටහා ගත යුතුය. උදාහරණයක් වශයෙන් කුමන කණ්ඩායම්, කුමක් සඳහා ගැටුමේ නිරත වී සිටින්නේද යන්න ආධාර කාර්ය-මණ්ඩල වටහාගත යුතුය. කණ්ඩායම් අතර, ආතතීන් ඇතිවන්නේ පද්ධතිගත මූල හේතූන් නිසාද, වංචනික ක්‍රියා නිසාද අවස්ථාවාදය නිසාද, එසේත් නැතිනම් වෙනත් ආසන්න හේතූන් නිසාද යනු තීරණය කිරීමට ඔවුන් එම ආතතීන්හි මූලාශ්‍රයන් හඳුනා ගැනීම අවශ්‍යය. ඔවුන් විසින් කුමන ගැටලු, භාවිතාවන්, ආයතන හෝ අත්දැකීම් ජනතාව බෙදාගන්නේදැයි දැන ගැනීම අවශ්‍ය වේ. ගැටෙන අනුකණ්ඩායම් අතර 'භේද කාරක' පිළිබඳව එවැනි පැහැදිලි බවක් නැතිව තමන් දෙන ආධාර ගැටුම් තුළට කා වැදී ඒවා තවත් නරක අතට පත් කරන්නේ ද (නැත්නම් ඒවාට සහනය සලසා ඒවා අඩු කරන්නේ ද) යන්න තේරුම් ගැනීමට ආධාර සේවකයෝ අසමත් වෙති.

එසේම යුද්ධය පැවතුණ ද ජනතාව එකිනෙකා සමග සම්බන්ධ ව සිටින ආකාරය ආධාර සේවකයින් විසින් වටහා ගැනීම අවශ්‍යය. LCPP මඟින් ගැටුමේ විවිධ පාර්ශවවලට ජනතාව බැඳ තැබීමට උපකාරී වන 'සම්බන්ධ කාරක' වර්ග ගණනාවක් සොයාගැනිණි. මීට අන්තර් ගත වන්නේ: (යටිතල පහසුකම් හෝ වෙළෙඳපොළ ක්‍රමය වැනි) පොදු පද්ධතීන් සහ ආයතන; (යුද්ධයේ අවුල් බව

නිසා අනෙක් පාර්ශවයේ පවුල්වලින් වෙන් කරනු ලැබූ දරුවන් 'හදා' ගන්නා අවස්ථාවන් වැනි) ආකල්ප සහ ක්‍රියාවන්; (යටත්විජිත වාදය පිළිබඳ පොදු ඉතිහාසය හෝ යුද්ධය පිළිබඳ වත්මන් යථාර්ථය වැනි) අතීත හෝ වත්මන් පොදු අත්දැකීම්; (පොදු ආගම් හෝ ළමුන් කෙරේ ආරෝපිත අගය වැනි) පොදු සාරධර්ම සහ අපේක්ෂා සහ (ස්මාරක, සහ ජාතික නිවාඩු දින වැනි) පොදු සංකේත සහ අවස්ථාවන් යනාදියි. එසේම ජනතා කොටස් අතර ඇති මෙම සබඳතාවන් පිළිබඳ දැනුමක් නැතිව, ආධාර සේවකයින්ට තමන්ගේ වැඩ කටයුතු මඟින් එබඳු සබඳතා නොතකා හරිනු ලැබේද? එමගින් ඒවා යටපත් කරනු ලැබේද? නැතිනම්, එසේ කරන්නේ කෙසේද යන්න හෝ, තම කටයුතු එම සබඳතා නිසි ලෙස පිළිගෙන ශක්තිමත් කරන්නේ ද, නැත්නම් එසේ කරන්නේ කෙසේද, යනු දැන ගැනීමට නොහැකිවනු ඇත.

ජාත්‍යන්තර ආධාර මඟින් අන්තර්-කණ්ඩායම් භේද සහ ආතතිය ශක්තිමත් කරන විට සහ අන්තර්-කණ්ඩායම් සම්බන්ධතා යටපත් කොට දුර්වල කරන විට, එම ආධාර යුද්ධය උග්‍ර අතට පත් කරන බව LCPP හි නිරත අය සොයාගත්හ; අන්තර්-කණ්ඩායම් භේද අඩු කරන විට සහ අන්තර්-කණ්ඩායම් සබඳතාවලට සහාය දී ඒවා ශක්තිමත් කරන විට ජාත්‍යන්තර ආධාර සාමය ප්‍රවර්ධනය කිරීමට සමත් වෙයි.

තෙවනුව ආධාර වැඩසටහනක බලපෑම, භේද ශක්තිමත් කරන්නේ ද නැත්නම්, සබඳතා ශක්තිමත් කරන්නේද යන්න ඇත්තේ එම වැඩසටහනේ විස්තරය තුළ යැයි LCPP මගින් එක් රැසක් කරන ලද අත්දැකීම්වලින් පෙනී යයි. ආධාර ලබා දෙන්නේ ද, වැඩකටයුතු කරන්නේ කොහි ද කවදා කොතරම් කාලයකට ද, දේශීය වශයෙන් යොදාගන්නේ කවුරුන් ද, ඉලක්ක කරන්නේ කවුරුන්ද, ජාත්‍යන්තර කාර්ය-මණ්ඩලයේ කාර්ය භාරය, අපේක්ෂා ඉටු කරගන්නේ කෙසේද, යන මේවා සහ මූලික කළමනාකරණ තීරණ වැනි වැඩසටහන් තීරණ සියල්ල ආධාර දෙනු ලබන ප්‍රදේශයේ අන්තර්-කණ්ඩායම් සබඳතා කෙරෙහි බලපෑම් ඇති කරයි.



LCPP හි නිරත, මානුෂීය සහ සංවර්ධන ආධාර සේවකයින් පෙළ මුහුණ දුන් සියලු තත්ත්වයන්හි දී අන්තර්-කණ්ඩායම් භේද වැඩි කරනු වෙනුවට අඩු කරන ආධාරදීමේ ක්‍රම සොයාගැනීමට හැකි වී ඇත. එසේම, පවතින සබඳතා යටපත් කරනු වෙනුවට එම සබඳතා පිළිගෙන ඒවා මත ගොඩනැගෙන විකල්ප වැඩසටහන් සොයාගැනීමට ද හැකි වී ඇත. සෘණාත්මක ගම්‍යමාන ආචාර-ධර්ම පණිවුඩ වළක්වා ගැනීම සඳහා විකල්ප සහ විකල්ප මාර්ග සොයාගැනීමෙහිලා ද ආධාර සේවකයෝ නිරතුරුවම නිර්මාණශීලී ව ක්‍රියා කරති.

LCCP හි සියලු අදියරවලදී - එනම්, ප්‍රත්‍යෙක අධ්‍යයන, ප්‍රතිපෝෂණ වැඩමුළු, සැබෑ ව්‍යාපෘති පරිස්ථිතිවල දී හානි නොකිරීමේ ප්‍රවේශය හා ව්‍යුහ හා ආදේශ තුළට හානි නොකිරීම මහා ප්‍රවාහගත කිරීම යනාදියේ යොමුව වී ඇත්තේ ගැටුම කෙරේ ආධාරවල බලපෑම් සොයා බැලීම හා තක්සේරු කිරීමයි.

## 3. සාම භාවිත ව්‍යාපෘතිය ගැන ප්‍රත්‍යවේක්ෂණය

1999 දී, LCPP ආදේශය අනුගමනය කරමින් ගැටුම් පිළිබඳව කටයුතුවල නිරත වී සිටින ජාත්‍යන්තර ආයතන ගණනාවක් සාම භාවිත ව්‍යාපෘතිය ගැන ප්‍රත්‍යවේක්ෂණ ව්‍යාපෘතිය (RPP) තුළ එකට එක්වූ හ. ඔවුන් ක්‍රියාවට නගන කුමන ක්‍රියාවන් ඵලදායකද, කුමන ක්‍රියාවන් ඵල රහිත ද, කුමන

තත්ත්වයන් යටතේ ඔවුන්ගේ ක්‍රියාවන් ඵලදායක වන්නේද, ඵලදායක නොවන්නේද යනාදිය පිළිබඳව වැඩිදුරටත් අධ්‍යයන කිරීම සඳහා, මෙම ආයතනවල සාමූහික සහ සන්සන්දනාත්මක අත්දැකීම් ක්‍රමානුකූල ලෙස සලකා බැලීම, මෙම ප්‍රයත්නයේ අරමුණයි. එමෙන්ම, පුළුල් භූගෝලීය ස්ථානීය ව්‍යාප්තියක් පුරා විවිධ අවධිවල දී විවිධ ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද නොයෙක් වර්ගයේ සාම ප්‍රවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ බහුවිධ ප්‍රත්‍යෙක අධ්‍යයන මගින් පුළුල් අත්දැකීම් පරාසයක් එක් රැස් කර ගන්නා ලදී. ප්‍රත්‍යෙක අධ්‍යයන විසි හයක් සම්පූර්ණ කරන ලදුව, ගැටුම් කලාපය තුළ හා ඉන් පිටත සිටින වෘත්තිකයින් සම්බන්ධකර ගනිමින් එම වාර්තා කියැවීම. සාකච්ඡා කිරීම හා විශ්ලේෂණය කිරීම මගින්, සාම කටයුතුවල ඵලදායකත්වයට හෝ එසේ නොවීමට බලපාන්නා වූ ද සියලු පරිස්ථිති අතර කේන්ද්‍රීය වන්නා වූද කාරණා එකොළහක් හඳුනා ගන්නා ලදී.

ඊළඟ මාසවල දී ප්‍රතිපෝෂණ වැඩමුළු මාලාවක් යළිත් පැවැත්වුණු අතර, මෙවර ඒවා මෙම කාරණා විභාග කර බැලීම සඳහාත්, ඒවා ගැන කුමන අත්දැකීම් ඉගැන්විය හැකිද යන්න දැන ගැනීම සඳහාත්, ලෝකයේ කලාප ගණනාවකින් (ගැටුම් ප්‍රදේශ ගණනාවකින් ද) පැමිණි සාම වෘත්තිකයින්ගේ සහභාගීත්වය ඇතිව පැවැත්විණි. වැඩි වැඩියෙන් වැඩමුළු පැවැත්වෙන විට සාකච්ජා වැඩි වැඩියෙන් ඵලදායකත්වය පිළිබඳව අවධානය යොමු කළේය. මෙහිදී කේන්ද්‍රීය ප්‍රශ්න වූයේ, අ) ඵලදායී වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම සඳහා ගැටුමක් පිළිබඳව සාම ආයතනයකට අවශ්‍ය කරන දැනුම, ආ) කොහි දී, කවදා කෙබඳු වැඩකටයුතු වර්ග සාර්ථක වේද යන්න සහ ඇ) සාම කටයුතු පිළිබඳ ව්‍යාකූල වූ කරළියෙහි සාර්ථකත්වය තක්සේරු කිරීමේ ක්‍රමයයි.



මෙම ව්‍යාපෘතියේ නිරත වූද සාම ක්‍රියාවන්ට අදාළව සංකීර්ණ ලෝකයේ දිනපතා කටයුතු කරන්නා වූද සියල්ලන්ම පුදුමයට පත් කරමින් ඵලදායකත්වය සොයාගෙන ඇගැයීම සඳහා ප්‍රයෝජනවත් යැයි ඔප්පු කෙරුණු පැහැදිලි පාඩම් ඉදිරිපත් විය. මේවා *Confronting war: Critical Lessons for Peace Practitioners* (Anderson and Olson 2003) යන ප්‍රකාශනයෙහි එක් රැස් කෙරිණි. 2003 සැප්තැම්බර් මාසයේදී ලෝකයේ නිශ්චිත ප්‍රදේශවල කටයුතු කරන සාම ආයතනවලින් සැදුම්ලත් කණ්ඩායම් RPP පාඩම්වල ප්‍රයෝජනවත්භාවය සහ බලපෑම් පරික්ෂා කර බැලීම සඳහා වසර දෙකක කාලයකට තමන්ගේ ක්‍රියාත්මක වැඩසටහන්වලට ඒවා යොදාගන්නා නිසා, RPP ද නොකඩවා පවතිනු ඇත.

මෙහි දී බලපෑම් ඇගැයීම කෙරෙහි යොමු වීමේ අරමුණ සඳහා RPP වෙතින් උගත් පාඩම් තුනක් වැදගත් වේ.

පළමුව, ගැටුමේ සන්දර්භය පිළිබඳ පූර්ණ අවබෝධයක් සාර්ථක වැඩකටයුතු සඳහා අත්‍යවශ්‍ය බවට සාම වෘත්තිකයෝ විශාල පිරිසක් එකඟ වෙති. එහෙත් කොපමණ දැනුමක් ප්‍රමාණවත් ද, කුමන දැනුම වඩා වැදගත්ද, සහ දැනුම ප්‍රයෝජනවත් විශ්ලේෂණයක් බවට පරිවර්තනය වන්නේ කෙසේද, යන කරුණු පිළිබඳව ඇත්තේ සුළු එකඟතාවකි. කුමක් වුවද, RPP අත්දැකීම සන්දර්භ විශ්ලේෂණයේ අත්‍යවශ්‍ය අංග හතරක් පෙන්නුම් කරන අතර, ඒවා අවබෝධ නොකර ගතහොත් සාර්ථකත්වය අත්කර ගැනීමේ හැකියා බරපතළ ලෙස යටපත් කෙරෙනු ඇත. සන්දර්භ විශ්ලේෂණය පිළිබඳ මෙම අංග හතර නම්:

1. නවතනු ලැබිය යුත්තේ කුමක් ද? කවුරුන්ද? ගැටුමට ප්‍රබල විකල්පයක් ගොඩනැගිය හැකි නම් ගැටුම අවසාන වනු ඇතැයි විශ්වාස කරමින් බොහෝ සාම ක්‍රියාකාරිකයෝ ප්‍රචණ්ඩත්වයට හෝ ගැටුමට යහපත් විකල්ප ගොඩනගන්නේ කෙසේදැයි කල්පනා කරති. එහෙත් ගැටුම් බොහොමයක් නොවෙන්නේ නම් ගණනාවක් ගැටුමෙන් දේශපාලන වශයෙන් හෝ ආර්ථික වශයෙන් වාසි ලබන පුද්ගලයින්ගේ උනන්දුව මගින් මෙහෙවනු ලබන බව අත්දැකීම් පෙන්වා දෙයි. මේවා වටහා ගෙන විශ්ලේෂණය කොට මේ ගැටලුවලට පිළියම් යෙදීමට යම් යම් නියත වැඩසටහන් ප්‍රවේශ ක්‍රියාත්මක නොකළහොත් සාමය ස්ථාපිත කරන්නට ගන්නා වූ උත්සාහයන් හානිකර ක්‍රියා මගින් නිරතුරුව යටපත් කෙරෙනු ඇත.

2. ආධාර කළ යුත්තේ කුමකට ද කාහට ද? පළමුව, ජනතාව සටන් නොකරන ක්ෂේත්‍ර සහ මතභේද වෙනුවට එකඟතා ඇති වී තිබෙන කරුණු හඳුනා ගෙන විශ්ලේෂණය නොකොට සාම ක්‍රියාකාරිකයෝ බොහෝවිට සාම වැඩසටහන් ඉදිරිපත් කරති. මෙම දැනුම නැතිව සාමය වැඩසටහන් සාම සඳහා වූ පවතින යාන්ත්‍රණයන්ට සහාය වීමේ අවස්ථා අහිමි කරගනී.

3 ගැටුමේ අභ්‍යන්තර මෙන් ම බාහිර සාධක මොනවා ද? බොහෝ යුද්ධවල අන්තර්ජාතික හා / හෝ අන්තර්කලාපීය මෙන්ම දේශීය මාන ඇත. සාර්ථක වන්නට නම් සාම ක්‍රියා උපායයන් සැබෑ සටන් ප්‍රදේශයෙන් පිටත ඇති ප්‍රචණ්ඩත්වය කෙරේ බලපාන සහ සමහරවිට ප්‍රචණ්ඩත්වය ස්ථාවර කරන, සාධක ද සැලකිල්ලට ගත යුතුය.




4. යෝජිත ක්‍රියාමාර්ගය මීට පෙර පරික්ෂා කර බලන ලද්දේ ද, එසේ නම් කුමන ප්‍රතිඵල ලැබුණේද? බොහෝ විට සාම වෘත්තිකයෝ වෙනත් අය කලින් ක්‍රියාත්මක කොට නිසි ප්‍රතිඵල ලබා නොදුන් වැඩසටහන් යළි යළිත් ක්‍රියාත්මක කරති. උදාහරණයක් වශයෙන් වැඩි වැඩියෙන් සංවාද පැවැත්වීම හොඳ යැයි හඟිමින් බොහෝ දෙනා සංවාද සංවිධානය කරති. එහෙත් මෙය සත්‍යයැයි කියා හෝ, අනෙක් සංවාදයන් අසාර්ථක වන විට නිශ්චිත සංවාදයක් සාර්ථක වනු ඇතැයි කියා හෝ, සන්දර්භ විශ්ලේෂණය මගින් පෙන්වා දෙනතාක් මිනිසුන් කටයුතු කරන්නේ වෙනසක් ඇති කිරීමේ එතරම් සම්භාවිතාවක් නැති යමක් සම්බන්ධයෙනි.

දෙවනුව සාම වෘත්තිකයින් තමන්ගේ කටයුතුවල ප්‍රධාන දීර්ඝකාලීන ඉලක්ක දෙකක්, එනම් ප්‍රචණ්ඩ ගැටුම් අවසන් කිරීම සහ සාධාරණ, කල්පවතින සාමයක් ගොඩනැගීම, සම්බන්ධයෙන් එකඟ වන බව පෙනේ. සමහර ආයතන මේවායින් එක් ඉලක්කයක් කෙරෙහි අවධානය යොමු කරති. අනෙක් අය ඉලක්ක දෙක කෙරෙහිම එකවර අවධානය යොමු කරති, එසේ වුවද, සමහර සාම ක්‍රියාවන් නියත වශයෙන් ප්‍රචණ්ඩ ක්‍රියා අවම කිරීම දෙසයට යොමු කරනු ලැබුව ද (උදාහරණයක් වශයෙන්, අන්තර්-ස්ථානගත කිරීමේ සහ සහගාමී උත්සාහයන්) සාධාරණ කල්පවත්නා සාමය පිළිබඳ අවසාන ඉලක්කය ඍජු ලෙස ව්‍යාපෘති විකල්පයන් සහ උපායයන් බවට සාධනය කිරීම වෙනුවට ව්‍යාපෘති ක්‍රියාමාර්ගවලට බද්ධ වී ඇතැයි බොහෝ විට උපකල්පනය කෙරේ. යම් දිනෙක ඒ 'සියල්ල එක්වෙනු ඇතැයි' උපකල්පනය කරමින් 'සාමය සඳහා' බොහෝ දෙනා බොහෝ දේ කරති. මෙම උපකල්පනය සත්‍ය නොවන බව RPP මගින් එක් රැස් කරන ලද සාක්ෂි කියාපායි. බොහෝ යහපත් ක්‍රියාවන් සාමයට හුදෙක් එකතු වන්නේ නැත.

තෙවනුව RPP හි සහභාගීවන්නන් පළමුව සාමය සඳහා ක්‍රියාත්මක කෙරෙන සිද්ධි අධ්‍යයනවලින් වැසුණු ක්‍රියාමාර්ග පෙළ මගින් විස්මයට පත් වුණද, කල් යාමේ දී, සියලුම සාම ක්‍රියාවන් සරල වගුවකින් දැකිය හැකි බව පැහැදිලි විය (රූප සටහන 1). මෙම රූප සටහන පෙන්වන්නේ සාමය සඳහා වූ උපායයන් බොහෝ මිනිසුන් සම්බන්ධවීමෙන් සාමය ගොඩනැගේය යන්නේ සිට සාමය සාර්ථක වන්නේ උසස් තරතිරම්වල සිටින, සමහර මිනිසුන්ගේ සම්බන්ධ වීම යන්න දක්වා පරාසය තුළ පවතින ආකාරයකි. මෙම පරාස 'බොහෝ ජනයා' සහ 'වැදගත් ජනයා' වශයෙන් දක්වෙයි. තවද, සාම වැඩසටහන් ක්‍රියාත්මක කරන්නෝ මූලික මට්ටම් දෙකක ක්‍රියා කරති: සමහරුන් පුද්ගලයා හා පුද්ගලයා සම්බන්ධ වෙනස (ආකල්ප හෝ සාම ඇගයුම් උගන්වාලීම වැනි) ගැන අවධානය යොමු කරන අතර සමහරු සමාජ-දේශපාලනික (සමාජ සාධාරණත්වයහා දේශපාලන අන්තර්ග්‍රහණය වැනි ආයතන වර්ධනය හෝ සංස්කරණය පෙර දැඩි කරගත් වැඩ සටහන් වැනි) වෙනස්කම් ගැන අවධානය යොමු කරති. මේවා රූප සටහනෙහි 'පුද්ගල / පෞද්ගලික' සහ 'සමාජ-දේශපාලන' යන පේළි වලින් දක්වා ඇත.

රූප සටහන 1




විවිධ උපායයන් සහ විවිධ මට්ටම්වල වැඩ කටයුතු පිළිබඳ මෙම සරල වගු ගත කිරීම RPP හි නිරත අයට කුමන තත්ත්වයක් යටතේ කුමන වර්ගයේ වැඩ කටයුතු ඵලදායක වන්නේද, නැද්ද යන්න සොයා ගැනීමට හැකියාව ලබා දුන්නේය. මෙහිදී ලැබුණු ප්‍රතිඵල විශිෂ්ටය.

සමාජ දේශපාලන මට්ටමේදී ආයතනික බලපෑම් බවට පරිවර්තනය නොවී පුද්ගල/ පෞද්ගල මට්ටමේ රැඳෙන වැඩ කටයුතු සාමය කෙරෙහි වටහාගත හැකි බලපෑමක් ඇති නොකරන බව RPP සොයාගත්තේය. එය හොඳ සහ ප්‍රයෝජනවත් වැඩක් (සහභාගීවන්නන් ඉන් තනි තනිව ලාභ ගත හැකිය) වුවද ගැටුම අවම කිරීමෙහිලා හෝ කල්පවත්නා සාමයකට දායක වීමෙහිලා එහි සාර්ථකත්වය දැනගත නොහැකිය. පොදු වැඩකටයුතුවලදී ජනතාව ද වෙනස් අන්දමට කටයුතු නොකරන්නේ නම් ඔවුන්ගේ ආකල්ප වෙනස් වීමෙන් ඵලක් නැත. එම කටයුතු සමාජ - දේශපාලන මට්ටමේ කටයුතු සමග සම්බන්ධ කෙරේ නම් සහ ඒවා එකට හමුවේ නම් පමණක් එම කටයුතු ඵලදායක වේ.

ඊට අමතරව, වැඩි ජනතාවක් කෙරෙහි අවධානය යොමු කරන කටයුතුවලට එයින්ම ගැටුම අවසන් කිරීමට හෝ සාමය ගොඩනැගීමට අවශ්‍ය කරන ප්‍රමාණවත් ශක්තිය අත්කර ගත නොහැකි බව RPP මගින් හඳුනා ගන්නා ලදී. ඵලදායකත්වය සඳහා වැඩි ජනතාවක් සාම ක්‍රියාවන්හි නිරත කිරීමට දරන ප්‍රයත්නයන් ප්‍රධාන පුද්ගලයින් සම්බන්ධ කරන ප්‍රයත්නයන්ට ද සම්බන්ධ විය යුතු අතර, එය අනෙක් අතට ද එසේමය. නායකයින් ජනතාව සූදානම් නැති ගිවිසුම් ඇති කරගන්නේ නම්, එම ගිවිසුම් කල් පවතින්නේ නැත. ජනතාවගෙන් බොහෝ දෙනෙකුට සාමය අවශ්‍ය නම්, එහෙත් ඔවුනට තම නායකයින්ගේ හෝ යුද්ධය මෙහෙයවන්නන්ගේ තීරණවලට බලපෑම් කළ නොහැකි නම් සාමය උදාවන්නේ නැත.

පුද්ගල / පෞද්ගලික මට්ටමේ කටයුතු සමාජ දේශපාලන වර්ධනයන් සමග ඒකාබද්ධ විය යුතුය සහ වැඩි ජනතාවගේ හා ප්‍රධාන ජනතාවගේ උපායයන් ඒකාබද්ධ විය යුතුය යන කරුණු දෙක රූප සටහනේ කොටුවේ පහතට හැරුණු සහ පහළ කෙළවරේ හරහට යොමු වුණු ඊ තල මගින් දැක් වේ.

## 4. බලපෑම් ඇගැයීමේ සහ තක්සේරු කිරීමේ LCPP අත්දැකීම

### 1. ප්‍රත්‍යක්ෂයන් සමග කටයුතු කරන ආධාරක ආයතන

වසර ගණනාවක් තිස්සේ ආධාර ආයතන තම කටයුතුවල ඍජු බලපෑම් ඇගැයීමෙහි නිපුණ වී සිටිති. ආධාරවල ප්‍රතිඵලයක් වශයෙන් මිනිසුන් කොපමණ සංඛ්‍යාවකට ආහාර දී ඇත්ද, නිවාස කොපමණ සංඛ්‍යාවක් අලුත්වැඩියා කොට ඇත්ද, දරුවන් කොපමණ සංඛ්‍යාවකට එන්නත් ලබාදී තිබේද ආදී වශයෙන් ඔවුහු නිරතුරුවම වාර්තා සකස් කරති. බොහෝ දෙනා වැඩි දියුණු කරන ලද ජල සහ සෞඛ්‍ය පද්ධතීන් නිසා ඇති වූ රෝග අඩුවීමේ තත්ත්වය වැනි තම කටයුතුවල යම් යම් වක්‍ර බලපෑම් පිළිබඳව නිවැරදි වාර්තා කිරීම දක්වා ඉදිරියට යති. ප්‍රතිලාභීන් සම්පත්වලින් ප්‍රයෝජන ලබනු ඇතැයි අදහස් කෙරෙන ක්ෂේත්‍රවලට බොහෝ ආධාර ආයතන දෙන සම්පත්වල බලපෑම් දැන ගැනීමේ වගකීම එම ආයතන භාර ගනිති.

එහෙත් LCPP සැලකිලිමත් වූයේ ආධාරවල ඍජු බලපෑම් පිළිබඳව නොව ගැටුම කෙරෙහි එහි අතුරු බලපෑම් පිළිබඳව ය. මේ සඳහා ආධාර ආයතන වගකිව යුතු බව පිළිබඳ සිය අවබෝධයෙහි ද, සිය කටයුතු කෙරෙහි ඇති කෙරෙන සැලසුම් නොකරන ලද සහ අනපේක්ෂිත දේශපාලන සහ සමාජ බලපෑම්වල වගකීම භාර ගැනීමෙහිද වැදගත් වෙනස්කම් කළ යුතු විය. තමන්ට විශේෂඥ දැනුම නැති ක්ෂේත්‍රවලට තමන්ට සම්බන්ධ වීම සිදුවීම ගැන ඔවුන් නොඉවසිලිමත් වූ අතර, කිසිසේත්ම නොමිණිය හැකි ප්‍රතිඵල මැන බැලීමට ඔවුන්ට සිදු විය.

### 2. රටා වලංගු සාක්ෂි වශයෙන් සැලකීම

ගැටුම සමග ආධාර අන්තර් ක්‍රියාකාරී වන පැහැදිලි, පුනරුක්ත වන සහ ව්‍යාප්ත රටා හඳුනා ගැනීමට LCPP ක්‍රියාවලි සමත් වූ පසු මෙම නොඉවසිලිමත් බව අඩු විය. සමුච්චිත සාක්ෂි, උදාහරණ වශයෙන් හමුදාවන් ශක්තිමත් කිරීම සඳහා හෝ ජන සංක්‍රමණවලට බලපෑම් කිරීම සඳහා හෝ ආහාර ආධාර වැරැදි විධියට යොදාගැනීම, බහුවිධ සැකසුම්වලදී නිශ්චිත, පදනමක් ඇති අත්දැකීම්වලින් ලැබුණු

පරිදි ආහාර පෝෂණ තත්ත්වය කෙරෙහි බලපෑම මෙන්ම සැලකිල්ලට ගැනීම බලකෙරෙනසුලුය. මෙම සමුච්චිත අත්දැකීමෙහි නිශ්චිත බව සහ නිවැරදි බව ආධාර සේවකයින් විසින් නිවැරදි සහ වලංගු යැයි සැලකෙන සාක්ෂි ඉදිරිපත් කළේය.

## 3. ඍණාත්මක සහ ධනාත්මක බලපෑම් ඇගැයීමේ වෙනස්කම්

ගැටුම කෙරෙහි ආධාරවල ධනාත්මක බලපෑම් නිවැරදිව සොයා ගැනීමට වඩා, ආධාරවල ඍණාත්මක බලපෑම් අහෝසි කිරීමේ මාර්ග සොයාගැනීම පහසු බව LCPP දැන ගත්තේය. තම ආධාර යම් අයුරකින් ගැටුම පෝෂණය කරන බව රාජ්‍ය නොවන සංවිධානයක් හඳුනාගත් විට, ඒ තත්ත්වය අවසන් කිරීමට ඊට පියවර ගැනීමට පුළුවන. නිශ්චිත ප්‍රශ්නයක් හඳුනා ගැනීමෙන් එම ප්‍රශ්නය විසඳෙන්නේ කවදාදැයි දැන ගැනීමට ද හැකිවන්නේය. උදාහරණයක් වශයෙන්, බටහිර අප්‍රියානු රටක කටයුතු කරන එක්තරා ඒජන්සි ආයතනයක් තමන් නොදැනුවත්වම ගැටුම් ප්‍රදේශයේ එක් වාර්ගික කණ්ඩායමකින් පමණක් තම දේශීය කාර්ය මණ්ඩලය බඳවා ගෙන ඇති බව දැනගත්තේය. එහි ප්‍රතිඵලය වූයේ එම වාර්ගික කණ්ඩායමට අයත් ගම්මානවල සහ පුද්ගලයින්ට වාසිදායක වූ ඒකාංශික වැඩසටහන් සකස් කිරීමත් එමගින් අන්තර්-කණ්ඩායම් ආතතීන් පෝෂණය කිරීමත්ය. ආයතනයේ කාර්ය-මණ්ඩලය මෙම තනි වාර්ගිකත්ව ප්‍රශ්නය හඳුනා ගත් පසු සහ තම බඳවා ගැනීමේ පටිපාටිය මෙම ප්‍රතිඵලයට මග පෑදූ ආකාරය විශ්ලේෂණය කර ගත් පසු, බඳවා ගැනීම් අනෙක් කණ්ඩායම් තුළටත් පුළුල් කොට අන්තර් කණ්ඩායම් නොසන්සුන්තාවන් පෝෂණය කිරීම වෙනුවට අන්තර් කණ්ඩායම් ශක්තිමත් කිරීමට ඔවුනට හැකි විය. තවත් ප්‍රදේශයක තම බෙදාහැරීමේ ට්‍රක් රථ සමූහය නඩත්තු කිරීම සඳහා කාර්මිකයින් පුහුණු කළ සෑම වාරයකදීම ප්‍රාදේශීය සටන්කරුවන් විසින් එම පුද්ගලයින් යුද පෙරමුණේ හමුදා වාහන නඩත්තු කිරීම සඳහා බඳවා ගනු ලැබූ බව එක් ආධාර ආයතනයක් දැන ගත්තේය. තම පුහුණුව හමුදාවට කෙසේ උපකාරී වන්නේදැයි හඳුනාගත් විට මෙම ආයතනය කාර්මිකයින් ලෙස කාන්තාවන් බඳවා ගෙන පුහුණු කිරීමට තීරණය කළේය. කාන්තාවන් හමුදාවට බඳවා ගනු ලැබුවේ නැත.

රටක සම්පූර්ණ ප්‍රදේශයක් පුරා ක්‍රියාත්මක වැඩසටහන්වල නිරත සිය ගණනක් වූ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සම්බන්ධයෙන් වුවද, කාර්මිකයින් කිහිප දෙනෙකුගේ සීමිත බලපෑම සම්බන්ධයෙන් පමණක් වුවද, ප්‍රශ්න හඳුනා ගැනීමෙහි නිශ්චිත භාවය ප්‍රශ්නයක විසඳුමෙහි නිශ්චිතභාවයට අනුරූපී වන ආකාරය මෙම නිදර්ශන දෙක අපට පැහැදිලි කරයි. අප විසින් ගැටුම නරක තත්ත්වයට පත් කරන්නේ කෙසේදැයි නිවැරදිව දන්නේ නම්, ඊට විකල්ප සොයා ගැනීමට සහ මූලික ඍණාත්මක ප්‍රතිඵල අහෝසි කිරීමෙහි සාර්ථකත්වය තක්සේරු කිරීමටත් අප සමත්වනු ඇත.

## 4. භේද-කාරක සහ සම්බන්ධ-කාරක දර්ශක ලෙස යොදාගැනීම

භේද-කාරක සහ සම්බන්ධ - කාරක ගැටුම කෙරේ ආධාරවල බලපෑම් පෙන්නුම් කරන දර්ශක බැව් LCCP ය වටහාගත් බව පෙනේ. භේද-කාරක හා සම්බන්ධකාරක වශයෙන් ගැටුම අවබෝධ කර ගැනීමේ වාසිය නම්, මේවා අන්තර් කණ්ඩායම් සබඳතාවල නිරීක්ෂණය කළ හැකි අංග බවට පත්වීමයි.

ආධාර කාර්ය මණ්ඩලය විසින් අන්තර් කණ්ඩායම් භේද හඳුනාගෙන විශ්ලේෂණය කළ විට, ඒවා තීව්‍ර වන්නේද නැත්නම් දුර්වල වන්නේද යන්න ඔවුනට නිරීක්ෂණය කළ හැකිය. උදාහරණයක් වශයෙන්, නිවාස ලබාගැනීමට ඇති හැකියාවේ අසමානත්වය කණ්ඩායම් භේද කොට ඇත්නම්, එම හැකියාවේ වෙනස්කම් (එම හැකියාව වැඩි කිරීම හෝ සීමාවන් තවදුරටත් දැඩි කිරීම) තක්සේරු කළ හැකිය. එසේම, අන්තර්-කණ්ඩායම් ආතතීන් ඉහළ හෝ පහළ යාමේදී දැකගත හැකි භේද, ජනතාවගේ චර්යාවන් තුළ ද නිරීක්ෂණය කළ හැකිය. මහා මාර්ග ආරක්ෂිත හා භාවිතයේ ඇති ඒවා ලෙස සැලකිය යුතුද නැත්නම් භයානක හා බැහැර කොට සිටිය යුතු ඒවා ලෙස සැලකිය යුතුද? ජනතාව දේශසීමා හරහා නිදහසේ එහා මෙහා ගමන් කරත් ද, නැත්නම් තමන්ගේම වූ කණ්ඩායම් සීමා තුළ රැඳී සිටිත් ද?

ඒ අයුරින්ම ආධාර ආයතන කාර්ය මණ්ඩල සම්බන්ධ-කාරකයන් හඳුනා ගෙන විශ්ලේෂණය කොට ඇති විට, ජනතාව ඒවා භාවිත කිරීම වැඩි කොට ඇත්ද නැත්නම් අඩු කොට ඇත්දැයි ඔවුනට දැක බලාගත හැකිය. උදාහරණයක් වශයෙන්, වෙළෙඳම සම්බන්ධ - කාරකයක් වී ඇත්නම්, ජනතාව තවදුරටත් (නැත්නම් යළිත්) වෙළෙඳපොළවල දී හමුවෙත්ද, නැත්නම් ඒවා මගහරිත්ද? ඔවුන් තම දරුවන් එකට පාසල් යවත්ද? ඔවුන් අලුත් වෙන් වෙන් පාසල් ගොඩනගත්ද?, එසේත් නැත්නම් ඔවුන් ළමුන් නිවසේ රැඳවා ගෙන සිටිත්ද?

භේද-කාරක සහ සම්බන්ධ කාරක අන්තර්-කණ්ඩායම් සබඳතාවන් පිළිබිඹු කරන ජීවිතයේ ආසන්න, නිරීක්ෂණ කළ හැකි මුහුණත් කෙරෙහි අවධානය යොමු කරයි.



## 5. ගතික ඇගැයීම

ගැටුම් ගතික ස්වභාවයෙන් යුක්ත වන නිසා බලපෑම් ඇගැයීම ද ගතික ක්‍රියාවලියක් විය යුතුය යන්න LCPP මගින් පැහැදිලි විය. එක් කාල පරිච්ඡේදයක ධනාත්මක වූ බලපෑමක් වෙනත් තත්ත්වයන් යටතේ ඍණාත්මක ඇගවීම් ඇති කළ හැකිය. භේද කාරකයන්ගේ සහ සබඳතා කාරකයින්ගේ බලපෑම් ගැටුම අවම කිරීමට ආධාරකයක් වීම සහතිකයක් වීම සඳහා ආධාර ආයතන ඒවා විශ්ලේෂණය කරන අතර එම විශ්ලේෂණය නැවත නැවතත් කරගෙන යා යුතුය. අන්තර් කණ්ඩායම් ගැටුම් වෙනස්වන තත්වයන් යටතේ එක් කාල පරිච්ඡේදයක භේද-කාරකයක් පසුව සම්බන්ධ-කාරකයක් බවට පත්විය හැකිය (උදාහරණයක් වශයෙන් යුද්ධය ජනතාව බෙදන නමුත්, සමහර තත්ත්වයන් යටතේ යුද්ධයේ අත්දැකීම සැබවින්ම සිවිල් කණ්ඩායම් අතර සම්බන්ධයක් ගොඩනැගිය හැකිය). මෙය අනෙක් අතට ද සිදුවිය හැකිය.

## 6. ගතිලක්ෂණ දැක්වීම

සමහර ප්‍රත්‍යෙකවලදී ආධාර වැඩසටහනක් යම් නිශ්චිත ප්‍රතිඵලයක් ඇති කළ බව ඉතා පැහැදිලිය. කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පිළිබඳ අපගේ කතාන්දර එවැනි ප්‍රත්‍යෙකයක විස්තර කරයි. එහෙත් බොහෝ අවස්ථාවන්හිදී බොහෝ දේවල් සිදුවන්නේ එක් වැඩසටහන් ප්‍රයත්නයක් නිශ්චිත ප්‍රතිඵල කෙරේ බලපා ඇති ආකාරය නිශ්චය කර ගැනීම දුෂ්කර වෙයි.

කෙසේ වෙතත්, ගැටුම් තත්ත්වයන් තුළ සිටින ජනතාව බොහෝ විට නිශ්චිත ක්‍රියාවලීන් අපේක්ෂිත ප්‍රතිඵලවල ලක්ෂණ දක්වන බව LCPP කටයුතුවලදී පැහැදිලි විය. ආධාර ආයතනයක වැඩ සටහන් සැකයේ හා තරගයේ ගින්නට පිදුරු දමන්නේද නැත්නම් සාධාරණ, සමබර සහ සියලු පාර්ශවයන් ඇතුළත් කරගන්නා ලෙස පෙනී යන්නේදැයි ඔවුහු 'දනිති'. තමන් දන්නා දේ දන්නේ කෙසේදැයි ඔවුනට පැහැදිලි සංඥා ලබාදිය හැකිය. ඔවහු හේතුව සහ ඵලය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කරති. බලපෑම් පිළිබඳව මත ඔවුන් වෙත ඇත.

මෙම මත ආධාර ආයතනවලට ඇති ඉතා හොඳ ලක්ෂණ දැක්වීමේ මූලාශ්‍රයක් ලබා දෙයි. වැඩසටහනක බලපෑම් ගැන ජනතාව කියන දේ දැන සිටීම සැබෑ බලපෑම් පිළිබඳ ඉතා හොඳ මිම්මකි. එසේම, ජනතාව මත වෙනසක් වාර්තා කරන්නේ නම්, එසේම මෙම වෙනස චර්යාමය වෙනස තුළ නිරීක්ෂණය කළ හැකි නම් සාක්ෂිය තවත් ප්‍රබල වනු ඇත.

## 5. සාම භාවිතාවන්හි බලපෑම් ඇගැයීමෙහිලා RPP අත්දැකීම

සාම වෘත්තිකයෝ බොහෝ විට අපැහැදිලි දෑ සම්බන්ධයෙන් කටයුතු කරති. ඔවුහු ආකල්ප ඇදහිලි විශ්වාසය ආරක්ෂාව පිළිබඳ හැඟීම සහ අන්තර්-කණ්ඩායම් නොසන්සුන්තාව හෝ වර්ධනය වන සාමයට දායක වන වෙනත් සාධක කෙරෙහි අවධානය යොමු කරති.

තම කටයුතුවල සාර්ථකත්වය ඇගැයීමට එරෙහිව RPP සාකච්ඡාවල දී යළි යළිත් මතු වුණු මූලික තර්ක හතරක් තිබුණි. පළමුව, 'සාමය අත්කර ගැනීමට දීර්ඝ කාලයක් ගන්නා' බවත්, ඒ අනුව නිශ්චිත සාම ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵල දැන ගැනීමට 'ඉක්මන් වැඩි' යැයි සමහරු කියා සිටියහ. දෙවනුව, සාමය සංකීර්ණ නිසා ප්‍රගතිය වෙනුවෙන් කුමන ක්‍රියාමාර්ග කුමන දායකත්වයක් ලබා දෙන්නේදැයි දැන ගත නොහැකි බව සමහරු කීහ. තෙවනුව, සාමය දිශාවට කෙරෙන ප්‍රගතිය වැනි අනිවාර්යයෙන්ම අප්‍රත්‍යක්ෂ වන දේ තක්සේරු කිරීම අපහසු බව බොහෝ දෙනා කියති. සිව්වැනුව 'ඵලදායක වනු' වෙනුවට 'විශ්වාසවන්ත වන ලෙසට' සහ 'හරි දේ කරන්නට' තමන්ගෙන් ඉල්ලා සිටින බව සමහරුන්ට හැඟේ. බොහෝ සාම වෘත්තිකයින් පොළඹවනු ලබන්නේ යම් යම් ප්‍රමිතීන් අනුව ජීවත්වීමට සහ කටයුතු කිරීමට ඇති ආධ්‍යාත්මික කැපවීම මගිනි. ඔවුහු ජයග්‍රහණ සහ සාර්ථකත්වයන් පිළිබඳව එතරම් සැලකිලිමත් නොවෙති.



ඒ අතර ම, RPP හි නිරත අති බහුතරයක් දෙනා සාමය ඇති කිරීම සඳහා වූ සිය දැඩි, බොහෝ විට නිර්භීත සහ ආත්ම පරිත්‍යාගශීලී ප්‍රයත්නයන් වෙතින් දක්නට ලැබෙන සීමිත ප්‍රතිඵල සම්බන්ධයෙන් සිය දැඩි කළ කිරීම හා අපහසුතාව ද සඳහන් කළහ. බොහෝ දෙනෙකුට ප්‍රතිඵල වැඩි දියුණු කර ගැනීමට සහ තමන් අපේක්ෂා කළ වෙනස ඇති කළේ (හෝ නොකළේ) කවදා දැයි දැන ගැනීමට ක්‍රමයක් සොයාගැනීමට අවශ්‍ය විය.

සාම ප්‍රගතියේ නිශ්චිත දර්ශක සන්දර්භය හරහා සාමාන්‍යකරණය කළ නොහැකි බව ඉතා ඉක්මනින්ම පැහැදිලි විය. උදාහරණයක් වශයෙන්, ගැටුම අවසාන කිරීමට කිසිවෙකු මෙතෙක් කිසියම් පැහැදිලි ක්‍රියාමාර්ගයක් ගෙන නැති ප්‍රදේශයක, දෙදෙනකු විසින් ක්‍රියාත්මක කරන ලද පොදු ක්‍රියාමාර්ගයක් විශාල ඉදිරි පියවරක් නියෝජනය කළ හැකි අතර, සිය ගණනක් ජනතාවගේ යුද විරෝධී පෙළපාලි

සාමාන්‍ය දෙයක් වී ඇති ප්‍රදේශයක, තවත් එවැනි සිද්ධියක් කිසිම ප්‍රගතියක් නියෝජනය නොකරනු ඇත. ඒ අනුව විවෘතව යුද විරෝධී කටයුතුවල නිරත ජනතාවගේ සංඛ්‍යාව ගණනය කර දක්වන දර්ශකයක් ස්ථාපිත කිරීම මගින් මෙම එක් එක් තත්ත්වයන්හි යථාර්ථය ග්‍රහණය කර නොගනු ඇත. සැබෑ බලපෑම තක්සේරු කිරීම සඳහා සන්දර්භය සහ කර ඇති දෑ අවබෝධ කර ගැනීම අවශ්‍ය වේ.

කෙසේ වෙතත්, පුළුල් RPP උපදේශන මගින්, සාම ක්‍රියාවේ දීර්ඝ කාලීන ඉලක්ක දෙක (ප්‍රචණ්ඩ ක්‍රියා අවසාන කිරීම සහ සාධාරණ කල්පවත්නා සමය ගොඩනැගීම) සඳහා වූ විවිධ ක්‍රියාමාර්ගවල දායකත්වය ඇගැයීමෙහිලා සාමාන්‍යකරණය කළ හැකි නිර්ණායකයන් (ස්ථානීය වූ දර්ශකයන් නොවේ) හඳුනා ගත හැකිය. බලපෑම් ඇගැයීම් සඳහා සාර්වත්‍රික වැදගත්කමක් ඇති ඵලදායකත්ව නිර්ණායක හතරක් හඳුනා ගැනිණි.

### ඵලදායකත්වයේ නිර්ණායක

RPP මගින් එක් රැස් කරන ලද සාක්ෂි මගින් සොයාගත් පරිදි සාම ක්‍රියා ප්‍රයත්නයක් ඵලදායී වන්නේ (දීර්ඝ කාලීන සාම ඉලක්කයන්ට වැදගත් දායකත්වයක් සපයන්නේ - 'සාමය මනාව ප්‍රකාශ වන්නේ;

- සහභාගීවන තමන්ම සාම කටයුතුවල නිරත වන්නට හේතු වේ නම්;
- ගැටුමට පාදක වූ දුක් ගැනවිලිවලට පිළියම් සොයන ප්‍රතිසංස්කරණවලට හා ආයතන ගොඩනැගීමට එය දායක වන්නේ නම්;
- ප්‍රචණ්ඩත්වයට හෝ ප්‍රචණ්ඩත්වයෙන් අයුතු ප්‍රයෝජන ගැනීමට වැඩි වැඩියෙන් එරෙහිවීමට එය ජනතාවට හැකියාව ලබා දෙන්නේ නම්;
- සහ එය ජනතාවගේ ආරක්ෂාව සහ ආරක්ෂාව පිළිබඳ අවබෝධය වැඩි කරන්නේ නම් ය.

මෙම නිර්ණායකයන්ගෙන් එකකට පමණක් දායක වන ප්‍රයත්නයකට වඩා මේ හතරම සහිත ප්‍රයත්නයක් ඵලදායක බව ද අත්දැකීම් පෙන්වා දෙයි.

අනෙක් වැඩසටහන්වලට සාපේක්ෂව ඕනෑම සාම භාවිතාවක ඵලදායකත්වය තක්සේරු කිරීම සඳහා ඒ පිළිබඳ අමතර ප්‍රශ්න තුනක් නැගිය යුතු බව ද ව්‍යාපෘතිය හඳුනාගති.

- එය ප්‍රමාණවත් තරම් වේගවත්ද? එනම් අපගේ ප්‍රවේශය නියමිත කාලයේදී ධනාත්මක වෙනසක් ඇති කරන්නේද, නැත්නම් වඩා වේගයෙන් ප්‍රතිඵල ලබාදිය හැකි වෙනත් යම් ප්‍රවේශයක් තිබේද?
- එය ප්‍රමාණවත් තරම් විශාල' ද? එනම් අපගේ ප්‍රවේශය ගැටුමේ පරිමාණයට සම්බන්ධ ද නැත්නම් වඩා විශාල බලපෑම් සහිත වෙනත් විකල්පයන් තිබිය දී පර්යන්තමය වශයෙන් කෙරෙන ක්‍රියාමාර්ග මගින් සෑහීමකට පත්වන්නෙමුද?
- එය නොනැසී පවතිනු ඇත්ද? එනම් අපගේ සාර්ථකත්වය අස්ථිර වනු ඇත්ද? නැත්නම්, අපි අන් සියලු කරුණුවලට වඩා කල්පවත්නා ඔරොත්තු දෙන බලපෑමක් සහිත උපායක් තෝරා ගෙන සිටින්නෙමු ද?

ඵලදායකත්වයේ නිර්ණායකයන් හතර සන්දර්භය පුරා යොදාගනු දක්නට ලැබී තිබේ. ඒ අනුව සෑම එකක්ම ගැටුමෙන් බැහැරට සහ සාමය වෙතට තල්ලු කිරීමේ ශක්තිය වැඩි කිරීම පිළිබඳ සාධකයක් නිරූපණය කරයි. අමතර ප්‍රශ්න තුන තවත් විකල්ප සහ ප්‍රවේශයන් සන්සන්දනය කරන සලකුණක් ස්ථාපිත කරයි. මෙම නිර්ණායකයන් සහ ප්‍රශ්න භාවිත කරමින්, සාම ක්‍රියා පිළිබඳ ආයතනවලට තමන් කටයුතු කරන සන්දර්භය විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, සාමයේ මහා පරිමාණ ඉලක්කවල සාර්ථකත්වයේ උපරිම හැකියාව ලබාදෙන වැඩසටහන් තෝරාගත හැකිය. එසේම වැඩසටහන් ක්‍රියාත්මක වන කාලය තුළ දී සහ ඉන් පසුව, නිර්ණායක ප්‍රභේද මගින් හඳුනාගන්නා ලද ක්ෂේත්‍ර හතරෙහි ඒවායේ බලපෑම් සම්බන්ධයෙන් විනිශ්චය කළ හැකිය.

## 6 LCPP සහ RPP අතර සමානකම් සහ වෙනස්කම්

ව්‍යාපෘතීන්ට අදාළ ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වන බොහෝ දෙනෙකු සම්බන්ධ කර ගැනීමට RPP සහ LCPP යන දෙක සංවිධානය කෙරිණි. ඒවා නිගමනාත්මක ඉගෙනීම වෙනුවට නිදර්ශනාත්මක ඉගෙනීම සඳහා සංවිධානය කෙරිණි. ඒවා පුළුල් අත්දැකීම් එක් රැස් කිරීමෙන් ආරම්භ කෙරුණු අතර, ප්‍රතිඵල විශ්ලේෂණය සහ සන්දන්දනය කිරීම මගින් පොදු තේමා ප්‍රශ්න, පාඩම් සහ රටා සොයාගත්තේය. උකහා ගන්නා පාඩම් පරීක්ෂණය සහ පුනර්පරීක්ෂණය සඳහා චින්තකයින් සහ ක්‍රියාධරයින් නිරත කරවීම සඳහා ඒවාට ප්‍රතිපෝෂණ ක්‍රියාවලීන් ගැබ්ව ඇත.

එහෙත් ව්‍යාපෘති දෙක අතර ප්‍රධාන වෙනසක් ඇත. LCPP ජාත්‍යන්තර ආධාරවල අතුරු ප්‍රතිඵල එනම්, එවැනි ආධාර දුක් කම්කටොළු අඩු කළ ද නැත්නම් සංවර්ධනය ප්‍රවර්ධනය කළ ද ඒවා ගැටුමට බලපාන ආකාරය අවධානය යොමු කරන අතර RPP අවධානය යොමු වන්නේ ගැටුම් සම්බන්ධයෙන් ක්‍රියා කරන ඒජන්සි ආයතන ඔවුන්ගේ මූලික අරමුණ ඉටු කරගන්නා හෝ ඉටු කර නොගන්නා ආකාරය (ගැටුම අඩු කිරීම හා සාමය ගොඩනැගීම) ඉගෙනීම කෙරෙහිය. මේ අනිවාර්යය වෙනස තිබුණද, බලපෑම් ඇගැයීම් පිළිබඳ බොහෝ කරුණු ව්‍යාපෘති දෙකටම පොදුය.

ඒවායින් පහක් නම්:

### 1. බලපෑම් වියුක්ත නොවේ

බලපෑම් නිරීක්ෂණය කළ හැකි ය. සාමාන්‍යකරණය කළ හැකි බලපෑම් දර්ශක නිර්මාණය කිරීමේ උත්සාහයේ දී මුහුණ දෙන ලද ප්‍රශ්නයක් නම් දුර පිළිබඳ ප්‍රශ්නයයි. LCPP අදාළ ස්ථානයේදී සමහර වැසටහන් ක්‍රියාමාර්ග ක්ෂණික බලපෑම් අවිනිශ්චිත බවකින් තොරව දුන ගැනීම ඉතාමත් පහසුය. උදාහරණයක් වශයෙන් පිරිමි කාර්මිකයින් බඳවා ගන්නා නමුත් කාන්තා කාර්මිකයින් බඳවා නොගන්නා බවත් කෙනෙකුට දැකගත හැකි විය. ප්‍රශ්නයක් නිශ්චිතවම හඳුනා ගැනීම විසඳුමක් නිශ්චිතව හඳුනා ගැනීමට උපකාරී විය. අන්තර් කණ්ඩායම් සබඳතා පිළිබඳ මෙම මූලිකාංග තුළ සාමයේ සහ ගැටුමේ වැඩසටහන්ගත බලපෑම් නිරීක්ෂණය කළ හැකි නිසා භේද කාරකයන් / සබඳතා කාරකයන් විශ්ලේෂණය LCPP යට මෙම නිශ්චිත බව ලබා දුන්නේය. උදාහරණයකින් දැක්විය හැකි පරිදි සමහර ක්‍රියාමාර්ගවලට / සහභාගී වන්නන් ව්‍යාපෘති සැලසුම් කරුවන්ගේ ක්‍රියාමාර්ගවලට වඩා ඔබ්බට ගොස් තමන් මූලිකත්වය ගත් විට (ඵලදායකත්වයේ නිර්ණක), හෝ නිශ්චිත තත්ත්වයන් යටතේ ප්‍රචණ්ඩ

ඉතිහාසයක් තිබුණු ප්‍රජාවන් එම තත්ත්වයන්ටම මුහුණ දී ගැටුමට ඉදිරිපත් නොවූ විට (ඵලදායකත්වයේ නිර්ණායකය 3) RPP යට මෙය පැහැදිලි විය.

උදාහරණයක් වශයෙන්, ඓතිහාසිකව මැතිවරණ පැවැත්වෙන විට බොහෝ ප්‍රජාවන් (සමහරවිට දැඩි ලෙස) අන්තර් කණ්ඩායම් ප්‍රචණ්ඩ ක්‍රියාවන් අත්දකිති. එහෙත් සාම ආයතනවල ඒකාවබද්ධ ක්‍රියාමාර්ගයකින් පසු 2003 මැතිවරණයේදී තමන්ගේ සුබ සාධනය යටපත් කොට, අනෙකෙකුගේ ඵල ප්‍රයෝජන සඳහා කටයුතු කරන්නට මීට කලින් තමන් අයුතු ලෙස යොදාගනු ලැබූ බව පිළිගනිමින්, බොහෝ ප්‍රජාවෝ සියලු ප්‍රචණ්ඩ ගැටුම්වලින් වැලකුණාහ.

### 2. සංඛ්‍යා වැදගත් වේ

LCPP සහ RPP යන දෙකෙහිම, බොහෝ ව්‍යුහයන් තුළ බොහෝ දෙනෙකුගේ අත්දැකීම නිරූපණය කරමින් රටාවන් සංචිතවීම, ගැටුම කෙරෙහි වැඩසටහන්ගත බලපෑම් පිළිබඳ සිත් කා වදින සාක්ෂි ලබා දුන්නේය. යම් නිශ්චිත ප්‍රතිඵලයක් යළි යළිත් නිරීක්ෂණය කළ හැකි වන්නේ නම් සහ බොහෝ ක්‍රියාධරයින් හේතු නිරූපණ අර්ථ දැක්වීම සම්බන්ධයෙන් එකඟ වන්නේ නම්, හුදු නිදර්ශන සංඛ්‍යාව සහ එකඟතාවේ පුළුල් බව ප්‍රතිඵලවල විශ්වසනීයත්වය තහවුරු කරයි.

### 3. ඉලක්ක අසමාහරණය (disaggregation) උපකාරී වේ



වැඩසටහනක් ගැටුම කෙරෙහි යහපත් බලපෑමක් වර්ධනය කරන ආකාරය නිසැක වශයෙන් දැන ගැනීමට වඩා වැඩසටහනක් හානිකර ප්‍රතිඵලයක් නැති කර දමන ආකාරය තක්සේරු කිරීම පහසු බව LCPP මගින් පැහැදිලි විය. එසේම RPP හි, සමගිය හා සාමය පිළිබඳ අවසාන ඉලක්කයේ ප්‍රගතිය තක්සේරු කිරීමට වඩා ප්‍රචණ්ඩත්වයේ අඩුවීම සොයාගැනීම පහසුය. ඉලක්ක ක්ෂණික සහ නිශ්චිත වන තරමට එය අත්කර ගැනීමේ සාර්ථකත්වය දැන ගැනීම පහසුය. (සාමය වැනි) විශාල ඉලක්ක, ඒ මාර්ගයේ කුඩා පැහැදිලි පියවර බවට අසමාහරණය (disaggregation) එහි ප්‍රගතිය තක්සේරු කිරීමේ ප්‍රයෝජනවත් ක්‍රමයක් ලබා දෙයි (එහෙත් කුඩා සහ සීමිත ඉලක්ක තබා ගැනීම වඩා පුළුල් සාර්ථකත්වයේ වගකීම මඟ හැරීමේ ක්‍රමයක් විය හැකිය. අපි ඒ ගැන මතු සඳහන් කරන්නෙමු).

### 4. ජනතාව 'දනිති'

වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන තත්ත්වයන් තුළ ජීවත් වන ජනතාව තුළ බලපෑම් සහ හේතු දැක්වීම පිළිබඳ මත (සහ බොහෝ විට වලංගු මත) ඇත. ඔවුහු නිශ්චිත සිද්ධිවල ප්‍රතිඵල ලක්ෂණ දක්වති. ඔවුහු බලපෑම් පිළිබඳ සහ බලපෑම් සනාථ කිරීම පිළිබඳ වැදගත් තොරතුරු මූලාශ්‍රයක් සපයති.

### 5. බලපෑම් අවට සිදුවීම් තරමට ගතික සහ වෙනස්වනසුලුය

ගැටුම් සන්දර්භයක් තුළ ඕනෑම දෙයක් වේගයෙන් සහ නිරන්තරයෙන් වෙනස්වන නිසා, මෙබඳු සන්දර්භ තුළ වැඩසටහන් බලපෑම් සොයා ගැනීමට දරන ඕනෑම උත්සාහයක්, ඒවායේ ගතික බව ද පිළිගත යුතුය. විශේෂයෙන්ම, බලපෑම් වෙනස් වන්නේ කෙසේද යන්න තීරණය කිරීම සඳහා

කාලයක් තිස්සේ බලපෑම් ගැන අධ්‍යයනය කිරීම වැදගත්ය (උදාහරණයක් වශයෙන්, කාර්මිකයින් ලෙස කාන්තාවන් පුහුණු කිරීමේ තීරණය, කාන්තාවන් බඳවා ගන්නා අයුරින් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිවල විතැන්වීමකට තුඩු දෙන බව LCPP ය තුළ විය හැකි දෙයක් වෙමින් තිබිණි).

බලපෑම් ඇගැයීම් පිළිබඳ RPP පාඩම් මගින් LCPP මගින් උගත් එවැනි පාඩම්වලින් දෙවිධියකින් වෙනස් වේ. LCPP හි දී භේද-කාරක සහ සම්බන්ධ-කාරක කෙරෙහි අවධානය යොමු කරන සන්දර්භය විශ්ලේෂණය, ගැටුම් කෙරෙහි මානුෂීය සහ සංවර්ධන ආධාරවල බලපෑම සොයාගැනීමට ප්‍රමාණවත් යැයි පෙනෙන අතර, ඉතිහාසය පිළිබඳ අවබෝධය සහ විශ්ලේෂණය පුළුල්වන තරමට, ගැටුම්වල වත්මන් අන්තර් ක්‍රියාකාරීත්වය ගතික ස්වභාවයෙන් යුක්ත වන තරමට, ආයතනයක් සාර්ථකවීමට ඇති හැකියාව වැඩි යැයි RPP සාක්ෂි පෙන්වා දෙයි. ඉහත RPP ප්‍රතිඵල තුළ දක්වන ලද සන්දර්භ විශ්ලේෂණය පිළිබඳ නිශ්චිත මූලිකාංග හතර ඵලදායී ඇගැයීම් සඳහා අත්‍යවශ්‍ය දෙයක් ලෙස නිරීක්ෂණය කෙරිණි. ඵලදායී වැඩ කටයුතු කරන්නට අවශ්‍ය සාම ක්‍රියාකාරීන්ට ඉන් ඔබ්බට ගොස් බොහෝ දේවල් දැන ගත හැකිය, දැනගත යුතුය. සාම වෘත්තිකයින් සාමය අත්කර ගැනීමෙහි ඍජු සහ කල්පවත්නා බලපෑමක් කරන්නට සිතන නිසා, ඔවුන් තමන් වැඩකරන සමාජය වෙත වඩා ගැඹුරින් සහ වඩා පුළුල් ලෙස මැදිහත් විය යුතුය. එහෙත් RPP අනුව දෙන ලද ඕනෑම ක්ෂේත්‍රයක දැන ගත යුතු දෙයෙහි නිශ්චිත කරුණු ඒ ඒ ක්ෂේත්‍රය තුළ විශේෂිත වේ. RPP අත්දැකීම අනුව මේවා පිළිබඳ සාමාන්‍යකරණය නොකළ හැකි ය.

දෙවැනි වැදගත් වෙනස ප්‍රතිඵලයට සම්බන්ධ වේ: RPP යේදී නම්, භාරගත් කාර්යය විවිධ උපායන් සහ (රූපසටහන් 1, කොටුවෙහි පාද හතරෙන් දක්වන ලද) විවිධ මට්ටම්වල දී සම්බන්ධ කිරීමේ වැදගත්කමයි. LCPP හි භේද කාරක සහ සම්බන්ධ - කාරක විශ්ලේෂණය කිරීමේ දී බොහෝ ආයතන සහයෝගීව කටයුතු කිරීම සහ ආධාර කෙරෙහි ඒවායේ ප්‍රවේශයන්, සමස්ත ආධාර වැඩසටහන් භේද කාරක පෝෂණය නොකොට සබඳධ කාරකයින්ට ආධාර කළ බවට සහතික කිරීමෙහි ලා වැදගත් විය. එහෙත් සාර්ථකත්වය සඳහා පෞද්ගලික/ පුද්ගල කටයුතු සමාජ - දේශපාලන ක්‍රියාමාර්ග සමග බද්ධ කිරීමත් වැඩි ජනතා උපාය ප්‍රධාන ජනතා උපාය, වැදගත් බද්ධ කිරීමත් කේන්ද්‍රීය සහ අත්‍යවශ්‍ය බව RPP අවබෝධ කොට ගත්තේය.

හානි කිරීමෙන් වැළකී, තනි ආධාර ආයතනයක් විසින් දේශීය හැකියාවන් සඳහා සහයෝගය සපයාදිය හැකි වුවත්, අනෙකුත් පාදයන්හි දැක්වෙන පරිදි කටයුතු සමග බද්ධ නොවන සාමය සඳහා ප්‍රවේශයක් අනුගමනය කරන ආයතනයක් සාම කටයුතුවලදී සිය ඉලක්ක වරද්දා ගනු ඇත. ඵලදායී විය යුතු යැයි සිතන ආධාර ආයතන සම්බන්ධයෙන් හුදෙකලාව කටයුතු කිරීමේ විකල්පයක් නැත.

## 7 අවසන් නිරීක්ෂණය

ප්‍රතිඵල සොයාගැනීම සහ අගැයීම් පිළිබඳ LCPP සහ RPP මගින් ඉගෙන ගන්නා ලද පාඩම්, බලපෑම් තක්සේරුව නිර්ගූඪන (demystifying) මාවතේ යම් දුරක් ගොස් ඇත.

අදාළ ස්ථානයේදී, නිශ්චිත අරමුණු සිත්හි ඇතිව ද දේශීය ජනතාවගේ අදහස්වලට සහ චර්යාවන්ට අවධානය යොමු කරමන් ද වැඩසටහන් ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වශයෙන් සිදුවී ඇත්තේ

කුමක්ද යන්න දැනගැනීමටත් ගැටුමක ක්ෂණික ප්‍රකාශනය කෙරෙහි මෙම කාර්යයෙහි බලපෑම ඇගැයීමටත් පුළුවන. ප්‍රයත්නයක අරමුණු උත්කෘෂ්ට මෙන්ම දීර්ඝ කාලීන වන විට, බලපෑම් දැන ගැනීම සහ ඇගැයීම සඳහා ඇති දුෂ්කරතාව වැඩි වේ.

පුළුල් ඉලක්කයක් ක්ෂණික සහ නිශ්චිත පියවර වශයෙන් අසමාහරණය කිරීමෙන් එහි බලපෑම් සොයා ගැන්මට උපකාරී වෙයි. එසේ වෙතත් එබඳු අසමාහරණයකින් වන හානිය RPP ව්‍යාපෘතියකින් මතු වූ අයුරු වාර්තා කරනු වටී. සාමය, විශාල නියත නොවන සහ සංකීර්ණ දෙයක් නිසා, සමහර සාම වෘත්තිකයෝ 'සුවය විඳින්න කිසිවක් නොකරන්න' නම් වැඩසටහන වෙතට යොමු වූ ප්‍රවණතාවක් හඳුනාගත්හ. එවැනි සංකීර්ණත්වයක් හමුවේ කුඩා පියවරයන් වශයෙන් වැඩසටහන් සකස් කිරීම යුද්ධය අවසන් කොට සාමය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කරන දේ නොකරන්නට පුළුවන. සාම වෘත්තිකයින්ට සුළු ප්‍රගතියකින් සෑහීමකට පත්වීමට හෝ අඛණ්ඩ දුක් පීඩාවන් ඉවසා සිටීමට හෝ නුපුළුවන. වඩා ඵලදායී වීමේ සහ වඩා පුළුල් බලපෑම් ඇති කිරීමේ හදිසි අවශ්‍යතාවක් ඇත.

සිය වැඩසටහන්වලදී හානි නොකරනු යන්නට වඩා වැඩි දෙයක් කළ හැකිය, එමෙන්ම කළ යුතුය යන්න ද ආධාර සේවකයෝ වැඩි වැඩියෙන් තේරුම් ගනිමින් සිටිති.

වසර ගණනාවක් පුරා කරන ලද පුළුල් වැඩ කටයුතු මගින් ලබාගන්නා ලද දැනුම ප්‍රයෝජනයට ගනිමින්, ඒවායේ ඵලදායීතාව වැඩි කොට ප්‍රචණ්ඩත්වයට යොමු නොවී වෙනස්කම් නිරාකරණය කරන, සාධාරණ සමාජ අත්කර ගැනීමෙහිලා සැලකිය යුතු හා කල්පවත්නා අන්දමින් දායකත්වය සැපයිය හැකි නිසා, ආධාර සේවකයින් සහ සාම වෘත්තිකයින් බලපෑම් ඇගැයීම තම කාර්යයෙහි අඛණ්ඩ කොටසක් ලෙස වැඩි වැඩියෙන් යොදා ගත යුතුය. ලෝකයේ සියලු වෘත්තීන් අතර, ආධාර බෙදාහැරීමෙහි සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙහි නිරතවූවන් ගකියාවක්ය යන හැඟීම ඉක්මවා නොකඩවා කටයුතු කිරීමට උත්සාහ කළ යුතුය.



## 8. වැඩිදුර කියවීම

Anderson, Mary B. 1999. *Do No Harm: How Aid Can Support Peace - or War,* London: Lynne Reinner Publishers.Inc.

Anderson, Mary B. and Lara Olson (with assistance from Kristin Doughty) 2003. *Confronting War: Critical Lessons for Peace Practitioners,* Cambridge, Mass: Collaborative for Development Action, Inc.